# කර්මාන්ත අමාත්‍යාංශය

# ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්

## තනතුරු පුරප්පාඩු - පුල්මුඩේ යන්ත්‍රාගාරය

පූර්ණ රජය සතු සමාගමක් වන ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනයෙහි සාමාන්‍යාධිකාරි තනතුර සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### සාමාන්‍යාධිකාරි (General Manager)

ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණය(HM-2-1)

පුරප්පාඩු පවතින ස්ථානය - පුල්මුඩේ යන්ත්‍රාගාරය ( පුරප්පාඩු -01)

(අවස්ථානුකූලව ප්‍රධාන කාර්යාලයේ හා පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සේවය කල යුතු වේ)

<u>**බාහිර අයදුම්කරුවන්**</u>

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/ විද්‍යාව/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය/ ගණකාධිකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමග

මානව සම්පත් කළමනාකරණය/ විද්‍යාව/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය/ ගණකාධිකාරණය/ ක්ෂේත්‍රයන්ට අදාල විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම.

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරු වල අවම වශයෙන් වසර 18 ක පළපුරුද්ද(අවම වශයෙන් මින් වසර 5 ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.)

හෝ

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / විද්‍යාව/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය/ ගණකාධිකරණය පිළිබඳ ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමග

මානව සම්පත් කළමනාකරණය/ විද්‍යාව/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය/ ගණකාධිකරණය/ පිළිබඳ විෂය ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් ලබා තිබීම.

සහ

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 5ක සේවා පළපුරුද්ද

<u>**අභ්‍යන්තර අයදුම්කරුවන්**</u>

ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර 5ක අදාල විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සමග

බහුවිධ කාර්යයන්හී නියුතු කණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමේ ලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණයෙහි ලා නිශ්චිත ප්‍රවීණතාවය.

<u>HM -2-1 සේවා ගණයට අදාල වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය</u>
කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 02/2016 අනුව
වැටුප් කේත අංකය - HM -2-1, රු.91,645/- =2700X12=124,045/-
රු.91,645/- වන ආරම්භක වැටුප් තලයෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ.

අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීමේදී පිහිටවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි තීරණය කරනු ලැබේ.

<u>**වයස් සීමාව**</u> : අවු: 35 ට නොඅඩු විය යුතු අතර, අවු: 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

<u>පොදුවේ ගෙවනු ලබන දීමනාවන්ට අමතරව HM -2-1 වැටුප් කාණ්ඩය සඳහා පහත සඳහන් දීමනාද හිමිවේ.</u>

1.PED/1/2015, PED/1/2015(i) හා PED/1/2015(ii) යන චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රවාහන දීමනාව හෝ රාජකාරි කටයුතු සඳහා ආයතනයේ වාහනයක් යන දෙකෙන් එකක් ලබා දීම.

2. රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2022 ප්‍රකාරව සන්නිවේදන බිල්පත් ගෙවීම.

3. කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 05/2017 ප්‍රකාර තනතුරට අදාල සක්‍රීය සේවා කාලය පදනම් කර ගෙන වෘත්තීය දීමනාව ගෙවීම් කරනු ලැබේ.

**<u>පොදු දීමනා හා ප්‍රතිලාභ</u>**

<u>දීමනා</u>

01. භාණ්ඩාගාරය අනුමත කළ රු.17,800/- වන ජීවන වියදම් දීමනාව
02. මාසික ආහාර දීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
03. මාසික පැමිණීමේ දිරිදීමනාව - දෛනික පැමිණීම මත පදනම් වේ.
04. මසකට රු.4,000/- වන දුෂ්කර දීමනාව (පුල්මුඩේ යන්ත්‍රාගාරයේ සේවකයන් සඳහා පමණි)
05. මාසික නිෂ්පාදනය මත ගෙවනු ලබන නිෂ්පාදන දිරි දීමනාව
06. රු.5,000/- වන මාසික අන්තර්දීමනාව

**ප්‍රතිලාභ**

01. වාර්ෂික ප්‍රසාද දීමනාව (බෝනස්)

02. ශල්‍ය හා රෝහල් ගතවීමේ හා බාහිර ප්‍රතිකාර සඳහා රක්ෂණාවරණය
i. වසරක් සඳහා රු.200,000/- ක රෝහල් ගතවීමේ රක්ෂණාවරණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
ii.වසරක් සඳහා රු.20,000/- ක බාහිර ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)
iii.වසරක් සඳහා රු.5,000/- ක දන්ත ප්‍රතිකාර බිල්පත් ප්‍රතිපූර්ණය (පවුලේ සාමාජිකයන් ඇතුලුව)

03.ස්ථාවර (නිශ්චිත) සීමාවක් දක්වා වෛද්‍ය වියදම් ලබා දීම.
i. අභ්‍යන්තර වෛද්‍යාධාර ක්‍රමය යටතේ වසර දෙකකට වරක් රු.12,000/- ක දීමනාව.
ii. අභ්‍යන්තර වෛද්‍යාධාර ක්‍රමය යටතේ වසරකට වරක් බාහිර ප්‍රතිකාර වෙනුවෙන් රු.5000/- මුදලක් ලබා දීම
iii.දරු උපතක් වෙනුවෙන් වසර 02 කට වරක් රු.12,000/- මුදලක් ලබා දීම.

05.මීට අමතරව ස්ථිර සේවකයන් සඳහා වන වෙනත් ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ඇත.

06. සේවකයා විසින් සේවක අර්ථ සාධක අරමුදල් දායකත්වය 10% ක්ද ,සමාගම විසින් 15% ක දායකත්වයක් සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා ආයතනයේ දායකත්වය 3% වේ.

**පොදු කොන්දේසි**

1. සෑම ඉල්ලුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වීම.
2. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.
3. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුයි.
4. තෝරා ගනු ලබන අයදුම්කරුවන්ගේ මුලු ඉපයීම් වලින්  උපයන විට ගෙවීම් බද්ද (Pay as You Earn Pay Tax) අය කරනු ලැබේ.

රාජ්‍ය සේවයේ/ සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම් වල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත්‍ර තම අදාල දෙපාර්තමේන්තුවල/ ආයතන වල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

ඉහත දක්වන ලද තනතුර සඳහා අයදුම්පත් යොමු කිරීමේදී ඊ මේල් ලිපිනයද ඇතුලත් කර ඔබගේ අත්සන සහිතව අයදුම්පත එවිය යුතු අතර, සියලුම සහතික පත්‍ර වල ඡායාස්ථ පිටපත් ඒ සමග එවිය යුතුවේ. (නිසි පරිදි සහතික පත්‍ර වල ඡායාපිටපත්  යොමු කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ)

ඔබ විසින් ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කර රාජගිරිය, සරණ මාවතේ, අංක 341/13 හි ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් හි සභාපති වෙත 2024 මැයි මස 27 දිනට පෙර ලැබෙන සේ ලියා පදිංචි තැපෑලෙන් අයදුම්පත් යොමු කල යුතු වේ.

**සභාපති**
**ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ්**
**අංක 341/13, සරණ මාවත, රාජගිරිය**.